සැ. යු.- මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2003 වර්ෂයේ ඔක්තෝබර්-දෙසැම්බර් කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනතට අනුව ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පළවේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,543 - 2008 මාර්තු මස 28 වැනි සිකුරාදා - 2008.03.28**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 320 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 321 |


සැ. යු.- (i) ශ්‍රී සුමංගල සරණසේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2008 පෙබරවාරි මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී .

(ii) සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත් කෙටුම්පත 2008 පෙබරවාරි මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත 2008 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු ගැසට් නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 අප්‍රේල් මස 04 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 මාර්තු මස 19 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.


317 - B 079662 —9,475 (2008/03)
B1 –

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත් දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි :**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලටද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරීන් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදලා හරිණු ලැබූ යුද්, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාව යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය :**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේව මුක්ත භටයින් ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එස සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු :**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනට ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම :**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය :**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදි වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවුවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිනේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත් හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයන්ත දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩි ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හො කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටි. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්ත දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ ප්‍රතයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යන්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයනී එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන් පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කළින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුසණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තිරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවුවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු - ඇබෑර්තු

## පොලිස් දෙපාර්තමේන්තුව

විශේෂ කාර්ය බලකායේ පොලිස් කොස්තාපල් හා පොලිස් කොස්තාපල් රියදුරු තනතුරු සඳහා බඳවා ගැනීම

ඉහත තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා 2007.12.28 දින පළ කර තිබූ රජයේ ගැසට් නිවේදන අංක 1530 ට අනුව අයදුම්පත් භාර ගැනීම 2008.03.28 දින සිට ඉදිරියට මාස 03 කින් එනම්, 2008.06.28 දින දක්වා දීර්ඝ කර ඇත.

පොලිස්පති.

03-826

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු – අම්පාර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශ වාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතුයි.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65ට වැඩි නොවිය යුතුයි.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුයි.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2008 අප්‍රේල් මස 25 දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මඟින් යැවිය යුතුය.

ඊ. ඇම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 මාර්තු මස 11 වැනි දින,
කොළඹ 11, කෙලින් වීදිය, අංක 280,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාශය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|---|
| 01 | අම්පාර | සමන්තුර | සමන්තුර බටහිර කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්‍යාලය, අම්පාර |
| 02 | අම්පාර | සමන්තුර | සමන්තුර දකුණ කොට්ඨාශයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධූරය | එම |

03-810

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු
අම්පාර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශ තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශ වාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතුයි.

02. මෙම තනතුරු සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65ට වැඩි නොවිය යුතුයි.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුයි.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2008 අප්‍රේල් මස 25 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතුය.

ඊ. ඇම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 මාර්තු මස 11 වැනි දින,
කොළඹ 11,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|---|
| 01 | අම්පාර | අඩ්ඩාලච්චේන | අඩ්ඩාලච්චේන-02 කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |
| 02 | අම්පාර | අම්පාර | අම්පාර නගර කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | එම |
| 03 | අම්පාර | සමන්තුර | මජීඩ්පුර ග්‍රාමය කොට්ඨාශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | එම |

03-809

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ දුම්රිය නියාමක තනතුරේ පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනීම

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය නියාමක තනතුරේ පුහුණු කිරීමේ ශ්‍රේණියට මෙම නිවේදනයේ සඳහන් පරිදි අවශ්‍ය සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියෙන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. දුම්රිය නියාමක ශ්‍රේණියේ පවත්නා පුරප්පාඩු සඳහා අයදුම්කරුවන් ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවා මණ්ඩලයේ පවත්නා පුරප්පාඩු සඳහා අයදුම්කරුවන් ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවා මණ්ඩලයේ අධීක්‍ෂණය යටතේ විභාග දෙපාර්තමේන්තුව මගින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 ට අනුකූලව පවත්වනු ලබන විවෘත තරඟ විභාගයකට පෙනී සිටීමට සලස්වා එම විභාගයේ දී දක්වන කුසලතාවයේ අනුපිළිලෙට බඳවා ගැනීම් කරනු ලැබේ. විභාගය, පවත්වනු ලබන දිනය, ස්ථානය හා වේලාව යථා කාලයේ දී අයදුම්කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

02. ඉල්ලුම් කළයුතු පිළිවෙල - ඉල්ලුම්පත්‍ර මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආකෘතියට අනුව ඒ 4 ප්‍රමාණයේ කඩදාසි දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අපේක්ෂකයා විසින්ම සකස් කර ගත යුතුය. අංක 01 සිට 07 දක්වා මුල් පිටුවේ ද අංක 08 සිට ඉතිරි පිටුවලට ඇතුළත් විය යුතුය.

I. රජයේ/සංස්ථා/පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සිය ඉල්ලුම්පත්‍ර ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය. එසේ අයදුම්පත් එවන විට අයදුම්පතේ සඳහන් කරුණු සත්‍ය බවටත්, ඔහු තෝරාගතහොත් සේවයෙන් මුදාහැරිය හැකි බවටත් ආයතන ප්‍රධානියා විසින් සහතික කර එවිය යුතුය.

II. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2008.05.02 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි " දුම්රිය සාමාන්‍යාධිකාරී, දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය, කොළඹ 10 " යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර එවන කවරයේ වම්පස ඉහළට කෙළවරේ "නියාමක පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කර එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර සෑම ආකාරයකින්ම සම්පූර්ණ හා නිවැරදි විය යුතුය.

III. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සහ *ගැසට්* නිවේදනයට අනුකූල නොවන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් හෝ ඒ හා සම්බන්ධ ලිපියක් තැපෑලේ දී නැතිවූ බවට කරනු ලබන පැමිණිලි සම්බන්ධයෙන් සලකා බලනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය* :-

දුම්රිය නියාමක පුහුණු කිරීමේ ශ්‍රේණිය

රා.ප.ච./ලේ. 06/2006 අනුව පළමු වසර සඳහා මසකට රු. 12,920 බැගිනි. දෙවන වසර සඳහා මසකට රු. 13,040 බැගින් වේ.

දුම්රිය නියාමක II පන්තියේ "ආ" ඛණ්ඩය සඳහා- රු. 14,140 -10 x 140-11x150-6 x210-14x290-රු. 22,510 වේ.

04. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* :-

i. ශුද්ධ ගණිතය හෝ ව්‍යවහාර ගණිතය/ භෞතික විද්‍යාව යන විෂයයන් දෙක සහිතව විද්‍යා විෂයයන් තුනකින් අ.පො.ස. (උ.පෙළ) විභාගය එකම අවස්ථාවක දී සමත්වීම සහ භාෂාව හෝ සාහිත්‍යය, අංක ගණිතය/ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සහිතව විෂයන් 06න් අ.පො.ස. (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වීම.

ii. අයදුම්කළ හැක්කේ පිරිමි අයදුම්කරුවන්ට පමණි.

iii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා දේහයකින් යුක්තවිය යුතුය.

iv. අයදුම්කරුවන්ගේ අවම උස ප්‍රමාණය අඩි 05 යි අඟල් 04ක් වියයුතුය.

v. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අයදුම්කරුවන් වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව බල නොපායි.

05. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

(අ) ඉහත 04 වැනි ඡේදයේ දක්වා ඇති සුදුසුකම් සහිත අයදුම්කරුවන් රා.ප.ච./ලේ 15/90ට අනුකූලව පැවැත්වෙන විවෘත තරග විභාගයෙන් එක් එක් විෂයකට අවම වශයෙන් 40% බැගින් හෝ ඊට වැඩියෙන් ලබා ඇති අයගේ කුසලතා අනුපිළිවෙලට අපේක්ෂකයින් අවශ්‍ය ප්‍රමාණයක් සම්මුඛ පරීක්ෂණයකට භාජනයකර සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. (මෙම පරීක්ෂණයේ දී ලකුණු දීමක් සිදු නොකෙරේ.) සුදුසුකම් සම්පූර්ණ කර ඇති අය අතුරෙන් වැඩිම ලකුණු ලබා ඇති අනුපිළිවෙලට පුරප්පාඩු පවතින ප්‍රමාණයට පමණක් නියාමක පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

(ආ) තරග විභාගයේ විභාග පරිපාටිය හා විෂයය නිර්දේශය පහත දැක්වෙන පරිදි වේ.

*විභාග පරිපාටිය:-*

i. විභාගය සිංහල/දෙමළ/ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය තුනෙන්ම පවත්වනු ලැබේ.
ii. අපේක්ෂකයකු තරග විභාගයට පෙනී සිටිය යුත්තේ එකම භාෂා මාධ්‍යයකිනි.
iii. මෙම විභාගයට නියමිත ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව දෙකකි.

i. බුද්ධි පරීක්ෂණය කාලය පැය 1 යි මුළු ලකුණු 100යි.
ii. තාක්ෂණ විෂයය කාලය පැය 3 යි. මුළු ලකුණු 100 යි.

*විෂයය නිර්දේශය :-*

i. *බුද්ධි පරීක්ෂණය:-* අපේක්ෂකයෙකුගේ සිතීමේ තර්කානුකූල භාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණ ගැනීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න ඇතුළත් බහුවරණ මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි.

ii. *තාක්ෂණ ප්‍රශ්න පත්‍රය.-* අ.පො.ස. (උ.පෙළ) මට්ටමින් ශුද්ධ ගණිතය/ව්‍යවහාරික ගණිතය හා භෞතික විද්‍යාව යන විෂයයන්ගේ දැනුම පරීක්ෂා කරන ආකාරයේ ප්‍රශ්න ඇතුළත් විස්තර වශයෙන් පිළිතුරු ලිවිය යුතු ප්‍රශ්න පත්‍රයකි.

එක් එක් විෂයයෙන් සුදුසුකම් ලැබීම සඳහා ලකුණු 40%ක් හෝ ඊට වඩා ලකුණු ලබාගත යුතුවේ. විභාගය සමත්වූවා සේ සැලකීමට විෂයයන් දෙකින්ම සුදුසුකම් ලබාතිබිය යුතුය. මෙම විභාගය කොළඹ දී පැවැත්වේ.

06. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි:-*

i. විවෘත තරග විභාගයෙන් තෝරාගත් අයදුම්කරුවන් පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කෙරෙන අතර, බඳවාගනු ලබන්නන් සේවයට අදාළ විෂයය නිර්දේශය අනුව ලබාගත් අවුරුදු දෙකක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණු කාලසීමාව අවසානයේ දී පවත්වනු ලබන විභාගය සමත්වීමෙන් අනතුරුව ශ්‍රීලංකා තාක්ෂණ සේවයේ II පන්තියේ "ආ" ඛණ්ඩයට පත් කෙරේ.

ii. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් හිමිය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

iii. තෝරාගනු ලබන්නන් ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග හා රජය මගින් දැනට නිකුත් කර ඇති සහ කලින් කල නිකුත් කරනු ලබන වෙනත් නියෝග හා රෙගුලාසිවලට ද යටත් විය යුතුය.

iv. තෝරාගනු ලබන්නන් දෙපාර්තමේන්තුවේ සම්මත අක්ෂි දෘෂ්ටි පරීක්ෂණවලින් සමත්වීමට යටත්වනු ඇත.

v. ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වූ ඡේදවල විධිවිධාන තනතුරට ගැලපෙන පරිදි අදාළ වනු ඇත.

07. *විභාග ගාස්තු .-* මෙම විභාගය සහා ආපසු නොගෙවන රු. 250ක ගාස්තුවක් අය කෙරේ. ඒ සඳහා කොළඹ 10, දුම්රිය සාමාන්‍යාධිකාරී නමට ලියූ මුදල් ඇණවුමක් ලඟම ඇති තැපැල් කාර්යාලයකින් ලබා ගෙන එහි ගෙවන කාර්යාලය මරදාන (01000) වශයෙන් දක්වා එය ඉල්ලුම්පත්‍රයට අමුණා එවිය යුතුය. මුල් පිටපත හැර ඡායා පිටපත් ඇමිණීම නොකළ යුතුය.

08. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.-* ඉල්ලුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු හෝ සාමදාන විනිශ්චයකාරවරයෙකු හෝ දිවුරුම් කොමසාරිස්වරයෙකු හෝ නීතිඥයෙකු, යුධ හමුදාවේ, ගුවන් හමුදාවේ අධිකාරී බලයලත් නියෝජිතයෙකු හෝ ස්ථිර තනතුරක් දරන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

ඉල්ලුම්පත් භාර ගැනීමේ අවසාන දිනය 2008.05.02 වේ.

ලලිතසිරි ගුණරුවන්,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

ලිපි ගොණු අංකය ප.15/1858/2006
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
කොළඹ 10.

### ආදර්ශ අයදුම්පත්‍රය

### *ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ දුම්රිය නියාමක තනතුරේ පුහුණු කිරීමේ ශ්‍රේණියට බාහිර අයදුම්කරුවන්ගෙන් බඳවා ගැනීමේ ඉල්ලුම්පත්‍රය*

01. අයදුම්කරු අයත්වන පරිපාලන දිස්ත්‍රික්කය :———.

| දිස්ත්‍රික්කය |
|---|
| |

02. (අ) මුලකුරු සමග නම (සිංහල/දෙමළ) :———.
මුලකුරු සමග නම (ඉංග්‍රීසියෙන්) :———.

(ආ) පෙළපත් නාමය සමග සම්පූර්ණ නම (සිංහල/දෙමළ) :——.
පෙළපත් නාමය සමග සම්පූර්ණ නම (ඉංග්‍රීසියෙන්) :——.

03. (අ) ස්ථිර පදිංචි ලිපිනය (සිංහල/දෙමළ) :———.
ස්ථිර පදිංචි ලිපිනය (ඉංග්‍රීසියෙන්) :———.

(ආ) ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය :———.

04. (i) උපන් දිනය :———.
(ii) අයදුම්පත් කැඳවන අවසාන දිනයට වයස:-
අවුරුදු :———. මාස :———. දින :———.
(iii) ජාතික හැඳුනුම්පත් අංකය :———.

05. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ කෙසේ ද යන වග :———.
(නිවැරදි පිළිතුර ඉදිරියෙන් " හරි✓ " ලකුණ යොදන්න)

| | |
|---|---|
| ලියාපදිංචියෙන් | |
| පරම්පරාවෙන් | |

06. ඔබ අයත්වන ජන වර්ගය (නිවැරදි කොටුවේ ජනවර්ගය හා සංකේත අංකය යොදන්න)

| *සංකේත අංකය* | *ජනවර්ගය* |
|---|---|
| 01 | සිංහල |
| 02 | ශ්‍රී ලංකා ද්‍රවිඩ |
| 03 | මුස්ලිම් |

| ජනවර්ග | සංකේත අංකය |
|---|---|
| | |

04 ඉන්දියානු ද්‍රවිඩ
05 බර්ගර්
06 මැලේ
07 වෙනත්

07. ඔබ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය:-
(නිවැරදි කොටුවේ හරි ලකුණ යොදන්න)

| | |
|---|---|
| සිංහල | |
| දෙමළ | |
| ඉංග්‍රීසි | |

08. අධ්‍යාපන සුදුසුකම් :
1. අ.පො.ස. (සා/පෙළ) විභාගය:-
සමත්වූ වර්ෂය:
විභාග අංකය:- භාෂා මාධ්‍යය:
පළමුවර

| විෂයය | සමත්වූ ශ්‍රේණිය |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| 9 | |
| 10 | |
| 11 | |

2. අ.පො.ස. (සා/පෙළ) විභාගය:
සමත්වූ වර්ෂය:
විභාග අංකය: භාෂා මාධ්‍යය:

| විෂයය | සමත්වූ ශ්‍රේණිය |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| 9 | |
| 10 | |
| 11 | |

3. අ.පො.ස. (උසස් පෙළ) විභාගය:
සමත්වූ වර්ෂය:
විභාග අංකය:- භාෂා මාධ්‍යය:

| විෂයය | සමත්වූ ශ්‍රේණිය |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |

09. ඔබ උසාවියකින් වැරදිකරුවකු වී දඬුවම් ලබා තිබේද ? :———.
(නිවැරදි කොටුව ඉදිරියේ හරි ලකුණ යොදන්න)

| | |
|---|---|
| ඔව් | |
| නැත | |

වරදකරුවෙකු වී නම් ඒ පිළිබඳ විස්තර ඇතුළත් කරන්න.
(දිනය, නඩු අංකය, වරද හා දඬුවම ඇතුළත්ව)

10. උස: (පාවහන් නොපැළඳ)
අඩි :———. අඟල් :———.

11. අයදුම්කරුගේ ප්‍රකාශය:

මෙම අයදුම්පත්‍රයෙහි මවිසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, එම තොරතුරු කිසිවක් හෝ අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සෙකුවීමට යටත්වන බවත්, පත්කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මා කිසිදු වන්දියක් නොලබාම සේවයෙන් පහකිරීමට යටත්වන බවත්, මම දනිමි. රුපියල් …… ක් ……තැපැල් කාර්යාලයට ගෙවා ලබාගත් මුදල් ඇණවුම මේ සමඟ අමුණා ඉදිරිපත් කරමි.

දිනය :———.

12. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම:

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ………………… … මහතා මා පෞද්ගලිකවම දන්නා හඳුනන අයෙකු බවත්, ඔහු අද දින මා ඉදිරිපිටදී ඔහුගේ අත්සන තැබූ බවත් මෙයින් සහතික කරමි.

———,
(සහතික කරන්නාගේ අත්සන)

අත්සන සහතික කරන නිලධාරියාගේ
සම්පූර්ණ නම :———.
තනතුර :———.
ලිපිනය :———.
දිනය :———.

(නිල මුද්‍රාව තබන්න)

13. දෙපාර්තමේන්තු හෝ සංස්ථා ප්‍රධානියාගේ නිර්දේශය:

……………………මහතා……………………………… මෙම දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ සේවයේ නියුතු බවත්, වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහුට විරුද්ධව නොනිමි විනය කරුණු කිසිවක් නොමැති බවත්, මෙම තනතුරට අදාළ නිවේදනයේ දැක්වෙන පරිදි තනතුරට අයදුම්කිරීමට අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවත්, ඔහු මෙම තනතුරට තෝරාගනු ලැබුවහොත් සේවයෙන් මුදවා හැරිය හැකි/නොහැකි බව ද ප්‍රකාශ කරමි.

———,
දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානියාගේ බලයලත්
නිලධාරියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න)

නම :———.
තනතුර :———.
ලිපිනය :———.
දිනය :———.

03-783

## සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය

වතු සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා සේවාවන් සැපයීමට අවශ්‍ය නිලධාරීන් පුහුණුවට බඳවා ගැනීම-2008

වතු ප්‍රදේශවල රෝග නිවාරණ සේවාවන් සහ ප්‍රධාන රෝහල් පළාත් සෞඛ්‍ය සේවාවට අන්තර්ග්‍රහණය කිරීමත් සමඟ එම සේවාවන් වඩාත් මැනවින් ලබාදීමේ අරමුණින් පහත සඳහන් තනතුරු යටතේ සෞඛ්‍ය සේවකයින් පුහුණුව සඳහා බඳවා ගැනීමට සෞඛ්‍ය අමාත්‍යාංශය තීරණය කර ඇත.

01. *අධ්‍යාපන සුදුසුකම්*:- මෙහි පහත දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් සියල්ල දෙමළ මාධ්‍යයෙන් ලබා තිබීම අනිවාර්ය වේ. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාග ප්‍රතිඵල ද, 2007 වර්ෂය සහ ඊට පෙර වර්ෂවල අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදු කෙරේ. (මෙම තනතුරු සඳහා අංක 1525 දරන 2007 නොවැම්බර් 23 වැනි සිකුරාදා පල කරන ලද *ගැසට් නිවේදනයට* අනුව නිසි පරිදි අයදුම්පත් ඉදිරිපත් නොකළ අයදුම්කරුවන් නැවත අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

| *තනතුර* | *අ.පො.ස. (උ.පෙළ) විභාගයේ සුදුසුකම්* | *අ.පො.ස. (සා.පෙළ) විභාගයේ සුදුසුකම්* |
|---|---|---|
| ඖෂධ සංයෝජක | විද්‍යා විෂය ධාරාවෙන් රසායන විද්‍යාවට සාමාර්ථයක් සහිතව විෂයයන් 03කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සමත්වීම (එකවර සමත්වී තිබීම) | ගණිතය, විද්‍යාව, භාෂාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් 6කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම |
| මහජන සෞඛ්‍ය පරීක්ෂක (පුරුෂ පක්ෂය පමණි) | විද්‍යා විෂය ධාරාවෙන් ජීව විද්‍යා විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් 03කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සමත්වීම (එකවර සමත්වී තිබීම) | ගණිතය, විද්‍යාව, භාෂාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් සහිතව ඉංග්‍රීසි භාෂාවද ඇතුලුව විෂයයන් 6කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම |
| පවුල් සෞඛ්‍ය සේවිකා (කාන්තා පක්ෂය පමණි.) | ඕනෑම විෂය ධාරාවකින් විෂයයන් තුනකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ ) විභාගය සමත්වීම | ගණිතය, විද්‍යාව, භාෂාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් 6කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම |

02. මෙම බඳවා ගැනීම් අදාළ පත්වීම ලබාදීමට නියමිත ආයතනය හෝ ප්‍රදේශය අයත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළින් සිදු කරනු ඇත. එම දිස්ත්‍රික්ක අයත් ප්‍රදේශ පහත දැක්වේ.

(I) ඖෂධ සංයෝජකයින් බඳවා ගැනීම සිදු කිරීම - අපේක්ෂිත දිස්ත්‍රික්ක/ප්‍රදේශ

| *දිස්ත්‍රික්කය* | *අයත් ප්‍රදේශ* |
|---|---|
| දිස්ත්‍රික්කය-බදුල්ල | හපුතලේ 02/වැලිමඩ 03/ලුණුගල 01/ බණ්ඩාරවෙල 02/බදුල්ල 01/හාලිඇල 01/ ඌව පරණගම 01/ පස්සර 01 |
| දිස්ත්‍රික්කය- රත්නපුරය | අයගම 01/බලංගොඩ 01/කහවත්ත 02/ගොඩකවෙල 01/කොලොන්න 01/ ඕපනායක 01/ නිවිතිගල 01/ රත්නපුරය 01 |
| දිස්ත්‍රික්කය - කෑගල්ල | දැරණියගල 02/දෙහිඕවිට 02/අරණායක 01/යටියන්තොට 03 |
| දිස්ත්‍රික්කය - කළුතර | බුලත්සිංහල 02/මිල්ලෙනිය 01/ බණ්ඩාරගම 01 |
| දිස්ත්‍රික්කය - ගාල්ල | යක්කලමුල්ල 01 |
| දිස්ත්‍රික්කය - නුවරඑළිය | වලපනේ 03/කොත්මලේ 01/හඟුරන්කෙත 01/නුවරඑළිය 01 |
| දිස්ත්‍රික්කය - මාතලේ | රත්තොට 01 |
| දිස්ත්‍රික්කය - මහනුවර | නාවලපිටිය 01 |

(II) මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් බඳවා ගැනීම

| *දිස්ත්‍රික්කය* | *අයත් ප්‍රදේශ* |
|---|---|
| දිස්ත්‍රික්කය - නුවරඑළිය | වලපනේ 04/අඹගමුව 12/හඟුරන්කෙත 01/ කොත්මලේ 04/නුවරඑළිය 16 |
| දිස්ත්‍රික්කය - මහනුවර | මැදදුම්බර 01/ පස්බාගේ කෝරළේ 02/ පන්විල්ල උඩපලාත 02/ගඟවට කෝරළේ 01/ ගඟ ඉහළ 01/ගලහ 01/ උඩ පළාත 01 |
| දිස්ත්‍රික්කය - මාතලේ | මාතලේ 01/උකුවෙල 01/රත්තොට 01/පල්ලේපොල 01 |
| දිස්ත්‍රික්කය - බදුල්ල | බදුල්ල 01/බණ්ඩාරවෙල 01/ ඇල්ල 01/හාලිඇල 02/හපුතලේ 02/හල්දුම්මුල්ල 01/ මීගහකිවුල 01/ පස්සර 02/ඌව පරණගම 01/ වැලිමඩ 01 |

| | |
|---|---|
| දිස්ත්‍රික්කය - මොණරාගල | බඩල්කුඹුර 01/බිබිල 01/මොණරාගල 01 |
| දිස්ත්‍රික්කය - රත්නපුරය | නිවිතිගල 01/රත්නපුරය 03/ඉඹුල්පේ 01/බලංගොඩ 01/ ගොඩකවෙල 01/කහවත්ත 03/කුරුවිට 01 |
| දිස්ත්‍රික්කය - කෑගල්ල | යටියන්තොට 01/දෙහිඕවිට 01/බුලත්කොහුපිටිය 01/දැරණියගල 01 |
| දිස්ත්‍රික්කය - කළුතර | අගලවත්ත 01/බුලත්සිංහල 01/මතුගම 01/හොරණ 01 |
| දිස්තික්කය - ගාල්ල | නාගොඩ 01 |
| දිස්ත්‍රික්කය - මාතර | කොටපොල 01 |

(III) පවුල් සෞඛ්‍ය සේවිකාවන් බඳවා ගැනීම

| *දිස්ත්‍රික්කය* | *අයත් ප්‍රදේශ* |
|---|---|
| දිස්ත්‍රික්කය - නුවරඑළිය | වලපනේ 07/අඹගමුව 40/හඟුරන්කෙත 02/කොත්මලේ 09/නුවරඑළිය 35 |
| දිස්ත්‍රික්කය - මහනුවර | මැදදුම්බර 03/පාතහේවාහැට 01/උඩුදුම්බර 01/පස්බාගේ කෝරළේ 05/පන්විල්ල උඩපළාත 01/ගඟවට කෝරළේ 01/උඩුනුවර 01/ ගලහ 04/උඩපළාත 05/යටිනුවර 01 |
| දිස්ත්‍රික්කය - මාතලේ | මාතලේ 02/උකුවෙල 03/පල්ලේපොල 02/අඹන්ගඟ 02/ගලේවෙල 01 |
| දිස්ත්‍රික්කය- බදුල්ල | ඇල්ල 02/හාලිඇල 06/හපුතලේ 01/හල්දුම්මුල්ල 01/මීගහකිවුල 02/පස්සර 06/ඌවපරණගම 05/ වැලිමඩ 02 |
| දිස්ත්‍රික්කය- මොණරාගල | බඩල්කුඹුර 03/ බිබිල 03/මොණරාගල 05 |
| දිස්ත්‍රික්කය- රත්නපුරය | ඇලපාත 01/කලවාන 01/රත්නපුරය 02/කොලොන්න 01/ඉඹුල්පේ 03/බලංගොඩ 03/ ගොඩකවෙල 01/කහවත්ත 03 |
| දිස්ත්‍රික්කය- කෑගල්ල | කෑගල්ල 01/යටියන්තොට 03/දෙහිඕවිට 04/වරකාපොල 01/බුලත්කොහුපිටිය 03/දැරණියගල 01 |
| දිස්ත්‍රික්කය- කොළඹ | පාදුක්ක 01/හංවැල්ල 01 |
| දිස්ත්‍රික්කය - ගාල්ල | නාගොඩ 03/කරන්දෙණිය 01 |
| දිස්ත්‍රික්කය- මාතර | කොටපොල 01 |
| දිස්ත්‍රික්කය- කුරුණෑගල | පොල්ගහවෙල 01/රිදීගම 01 |

03. *අනෙකුත් සුදුසුකම්* :-

(අ) 2008.04.21 දිනට වයස අවුරුදු 18ට නොඅඩු, වයස අවුරුදු 30ට නොවැඩි විය යුතුය
(ආ) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති විය යුතුය.
(ඇ) මනා ශාරීරික සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
(ඈ) තමන් අයදුම්කරන දිස්ත්‍රික්කය තුළ අවුරුදු තුනක් පදිංචි විය යුතුය.
(ඉ) පවුල් සෞඛ්‍ය සේවා තනතුරට අයදුම් කරන අයදුම්කාරියන්ගේ උස අඩි 4 අඟල් 10ට වැඩි විය යුතුය.

04. *අයදුම්කළ යුතු ක්‍රමය* :-

(අ) මේ සමඟ ඇති ආකෘති පත්‍රය අනුව අයදුම්පතක් සකස් කරගත යුතුවේ. අයදුම්පතේ "මුද්දර" යන ස්ථානයේ රුපියල් 200ක මුද්දරයක් අලවා තම අත්සන යොදා එය අවලංගු කල යුතුවේ.

(ආ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ/අධ්‍යාපන පරිපාලන සේවයේ/රජයේ ගණකාධිකාරි සේවයේ නිලධාරියෙකු/රජයේ විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/නීතිඥවරයෙකු හෝ වර්ෂයකට රුපියල් 1,24,080 ට නොඅඩු වැටුපක් ලබන රජයේ නිලධාරියෙකු විසින් අපේක්ෂකයාගේ අත්සන සහතික කල යුතුවේ.

(ඇ) අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර එය බහාලන කවරයේ වම් කෙළවරේ "වතු ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය නිලධාරීන් පුහුණුවට බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කොට 2008.04.21 දින හෝ ඊට පෙර " අධ්‍යක්ෂ (පාලන) 02, සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය, " සුවසිරිපාය" , 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 " යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

05. අයදුම්පත් ලැබුණ බව දන්වා එවනු නොලැබේ.

06. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

07. මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. ඉහත අධ්‍යාපන සුදුසුකම් හා අනෙකුත් සුදුසුකම් සපුරා ඇති අපේක්ෂක/අපේක්ෂිකාවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් විසින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කල යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී අවශ්‍ය සහතික මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(අ) උප්පැන්න සහතිකය

(ආ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතික හෝ සහතික නිකුත් කර නැතිවිට බාහිර අයදුම්කරුවන්ට නිකුත් කළ ප්‍රතිඵල ලේඛනයේ හෝ අයදුම්කරු විභාගයට පෙනී සිටි විදුහලේ විදුහල්පතිවරයා නිකුත් කළ මුල් ලිපිය යනාදී ලිපිලේඛන ;

(ඇ) විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ලකුණු මට්ටම් සඳහන් සහතිකය ;

(ඈ) ජාතික හැඳුනුම්පත/ගමන් බලපත්‍රය හෝ රියැදුරු බලපත්‍රය ;

(ඉ) දිස්ත්‍රික්කය තුළ අවුරුදු 03කට පදිංචිය සනාථ කිරීම සඳහා 2003,2004,2005 ඡන්දදායක ලැයිස්තුවේ සහතික කළ පිටපත්, අයදුම්කරුගේ නම ඡන්දදායක ලැයිස්තුවේ සඳහන්ව නොමැති නම්, ඔහුගේ දෙමාපියන්ගේ නම් ඡන්දදායක ලැයිස්තුවේ සඳහන්ව තිබිය යුතුය. එවැනි අයදුම්කරුවන් විසින් ඡන්දදායක ලැයිස්තුවේ සහතික කළ පිටපතට අමතරව ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද ග්‍රාමසේවා නිලධාරියාගෙන් ලබාගත් පදිංචිය පිළිබඳව සහතිකය ඉදිරිපත් කළ යුතුය.

09. *පුහුණු කිරීමේ පරිපාටිය:–*

(i) තෝරාගත් අයදුම්කරුවන් ඒ ඒ පුහුණු පාසල්වලට ඇතුළත් කරනු ලැබේ.

(ii) පුහුණුව සඳහා ඇතුලත් කරන අභ්‍යාසලාභීන් පුහුණු පාසල්වල බලපැවැත්වෙන නීතිරීතිවලට හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් කලින්කලට පනවනු ලබන වෙනත් නියෝගවලට ද යටත්වනු ඇත.

(iii) පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ නියමිත විභාගවලින් අසමත් වන හෝ වැඩ සහ හැසිරීම අසතුටුදායක වන හෝ තමන් ඇතුලත් කරගනු ලබන පුහුණු පාසලෙහි විභාග හා නිවාඩු කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන අභ්‍යාසලාභීන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව නතර කිරීමට හැකිය.

(iv) පුහුණු පාසලට ඇතුලත් වන අවස්ථාවේදී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණ කිරීමෙන් පසුව පත්වීම ලැබුණහොත් අවම වශයෙන් අවුරුදු 10ක කාලපරිච්ඡේදයක් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සේවය කරන බවටත්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමඟ ගිවිසුමකට එළඹිය යුතුය. පුහුණුව ලබන කාලය තුල පුහුණුවෙන් ඉවත් වුවහොත් හෝ පුහුණුව හැරගියහොත් ඉහත III ඡේදය අනුව පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවුවහොත් පුහුණු කාලය තුළ ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව සහ රජය විසින් දරන ලද වියහියදම් සඳහා වැය වූ මුදල ඔහු/ඇය විසින් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුවේ. එසේ නොවුවහොත්, ගිවිසුම් ප්‍රකාරව එම මුදල අයකර ගැනීමට නිසි පියවර ගනු ඇත.

10. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන් .–* පුහුණුව අවසානයේ දී අවසන් පරීක්ෂණයෙන් සමත්වන අපේක්ෂක/අපේක්ෂිකාවන්ට දෙපාර්තමේන්තුව මගින් ඔවුන් ලබා ඇති කුසලතාවය පදනම් කර ගනිමින් අදාළ තනතුරේ III පංතියේ තනතුරු සඳහා තෝරාගත් දිස්ත්‍රික්කවලට පත්කරනු ලැබේ.

11. *අධ්‍යාපන සුදුසුකම් හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර.–* ඉල්ලුම්පත්‍ර පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුලත් කළ යුතුය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම ලැබීමෙන් පසු ඉහත සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත් එම පත්වීම අවලංගු කොට පුහුණුවෙන්/සේවයෙන් පහකරන අතර, නැවත රජයේ සේවයට නොගන්නාවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ඇයගේ නම ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ.

12. තෝරාගත් අයදුම්කරුවන් අදාළ පාඨමාලාවන් හැදෑරීමට සහ ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික සහ මානසික වශයෙන් යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු වස් වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අපේක්ෂකයින් පුහුණු පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

13. ඉහත පරිදි බඳවාගනු ලබන සියළුම නිලධාරීන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට මුදල් හා වෙනත් රෙගුලාසිවලට ද, රජය විසින් වරින්වර පනවනු ලබන නීතිරීති හා නියෝගයන්ට ද යටත්වනු ඇත.

14. පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම ගැසට් නිවේදනය මගින් ආවරණය නොවන යම් ගැටළුසහගත කරුණක් උද්ගත වුවහොත්, ඒ පිළිබඳ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

වෛද්‍ය, එච්. ඒ. පී. කහඳලියනගේ,
ලේකම්,
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය.

2008 මාර්තු මස 13 වැනි දින,
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

**අයදුම්පත්‍රය**

*සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය*

———— *පුහුණුව සඳහා සිසුන් බඳවා ගැනීම- 2008*

01. (අ) මුලකුරු සමග අගට යෙදෙන නම :

(ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

02. තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

03. (i) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

(ii) දිස්ත්‍රික්කය :————.

(iii) ඔබ මෙම දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිකරුවෙක් ද? ඔව්/නැත

(iv) ඔව් නම් කොපමණ කලක පටන් ද? :————.

04. උපන් දිනය :

වර්ෂය:————, මාසය:————, දිනය:————.

2008.04.21 දිනට වයස :
අවුරුදු:————, මාස:————, දින:————.

05. ස්ත්‍රී පුරුෂ භාවය (අදාල කොටුවේ ✓ ලකුණ යොදන්න) :

| | |
|---|---|
| ස්ත්‍රී | |
| පුරුෂ | |

06. උස:
අඩි:————. අඟල් :————.

07. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග :————.

| | |
|---|---|
| ඔව් | |
| නැත | |

(අදාල කොටුවේ ✓ ලකුණ යොදන්න)

08. ජාතික හැඳුනුම්පත් අංකය :————.

09. විවාහක/අවිවාහක බව :————.

10. අධ්‍යාපන සුදුසුකම් :

(අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, (ලකුණු සටහන් පිටපත අමුණන්න) :

විභාගයට ඉදිරිපත් වූ දිස්ත්‍රික්කය:————.
වර්ෂය:————. විභාග අංකය:————.
Z ලකුණ:————.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 01. | |
| 02. | |
| 03. | |
| 04. | |

(ආ) අ.පො.ස. (සා.පෙ) විභාගය :

පළමු වාරය :
වර්ෂය:————. විභාග අංකය:————.

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 01. | | 07. | |
| 02. | | 08. | |
| 03. | | 09. | |
| 04. | | 10. | |
| 05. | | 11. | |
| 06. | | 12. | |

දෙවන වාරය:
වර්ෂය:————. විභාග අංකය:————.

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 01. | | 07. | |
| 02. | | 08. | |
| 03. | | 09. | |
| 04. | | 10. | |
| 05. | | 11. | |
| 06. | | 12. | |

11. උසාවියක් ඉදිරියේ ඔබ කිසියම් චෝදනාවකට වැරදිකරු වී ඇත්ද ?

| | |
|---|---|
| ඔව් | |
| නැත | |

(අදාල කොටුවේ ✓ ලකුණ යොදන්න)

ඔව් නම් විස්තර සපයන්න:————.

12. *අයදුම්කරුගේ සහතිකය:*

(අ) මම වෙනත් කිසිදු පූර්ණකාලීන පාඨමාලාවකට සහභාගී නොවන බවත් මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) ම විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා පුහුණුවට නුසුදුස්සකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් මා සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව මම දැන සිටිමි.

මුද්දර කොටුව

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

13. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම*:

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ...................... මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය 2008 ...... වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

————————,
සහතික කරන්නාගේ අත්සන
නිල මුද්‍රාව සහිතව

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ :
සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

03-880

---

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය**
Sri Lanka Institute of Printing
**ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය**
(1984 අංක 18 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද්දකි)

*පරිඝණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පරිඝණක ආශ්‍රිත මුද්‍රණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව*

***Certificate Course in Typesetting and Desk Top Publishing***

ශ්‍රී ලංකාවේ මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රයන්ට අදාළ පාඨමාලා හඳුන්වාදීමේ අද්විතීය ස්ථානයක් ලබා සිටින රජයේ මුද්‍රණ ආයතනය එම ක්ෂේත්‍රයට අදාළ දැනුම, හැකියා, දක්ෂතා සහ විශේෂඥතා ඥානය ප්‍රවර්ධනය කිරීම සඳහා මුළුමනින්ම කැපවී කටයුතු කරයි.

වර්ෂ 1984 දී පාර්ලිමේන්තු ආඥාපනතක් මඟින් ස්ථාපනය කරන ලද මෙම ආයතනය මුද්‍රණ සහ ග්‍රැෆික් ක්ෂේත්‍රයට අදාළ ඉහත සඳහන් පාඨමාලාව අප්‍රේල් මාසයේ දී ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මඟින් පවත්වනු ලබන මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මෙම පාඨමාලාව මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස් වන අතර ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තු වන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි. පරිඝණක ආධාරයෙන් අකුරු ඇමිණීම පිළිබඳව පුළුල් අවබෝධයක් මින් ලබාදෙන අතර පරිඝණක දැනුමක් මුල සිටම පරිඝනක භාවිතය සහ මෘදුකාංග අධ්‍යයනය (Computers and Software applications) පිළිබඳව මනා දැනුමක් හා සිත්තම් නිර්මාණය පිළිබඳ මූලික අවබෝධයක් ද ලබා දෙන අතර, මෙම පාඨමාලාව හැදෑරීමට අවශ්‍ය පූර්ණ දැනුම (Certificate course in Graphic Designing) හා අවබෝධය ලබාදෙයි.

| | | |
|---|---|---|
| පාඨමාලා කාලය | - | පැය 144 (මාස 5) |
| මාධ්‍යය | - | සිංහල/ඉංග්‍රීසි |
| ගාස්තු | - | රු. 9,500 |
| දින | - | සතිපතා සහ සති අන්ත සහ සන්ධ්‍යා පන්ති කිහිපයක් පැවැත්වේ. |

*පාඨමාලා අන්තර්ගතය (Course Contents)*

* Introduction to Computers
* Keyboard Training and Fonts
* Word Processing using MS Word
* Page Make-up methods using Adobe Pagemaker
* Introduction to Scanning and Image Manipulation
* Introduction to Vector Graphic Applications
* Page Make-up methods using Quark Xpress
* Introduction Internet

මෙම පාඨමාලාවන්ට ඇතුළත් වීමට ඇති ඉඩකඩ සීමාසහිත නිසා සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට පමණක් පාඨමාලා හැදෑරීමට අවස්ථාව ලැබේ. පාඨමාලා සාර්ථකව නිම කරන සිසුන්ට රජය පිළිගත් සහතිකයක් පිරිනැමේ.

*විමසීම්* :
ලේඛකාධිකාරී,
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 08.
දුරකථන අංකය : 2686162/2679791/ෆැක්ස් අංකය : 2686162.
e-mail : sliopreg@sltnet.lk

08-131

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.